**UNIVERSITY OF PERADENIYA**
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

පළමු වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය)
2018 දෙසැම්බර්
FIRST YEAR (100 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS
(EXTERNAL - NEW SYLLABUS) DECEMBER 2018

SUPE 006: බෞද්ධ උපදේශන මනෝවිද්‍යාව

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

---

1. බෞද්ධ උපදේශන මනෝවිද්‍යා විෂය හැදෑරීම තුළින් සමාජ ගැටළු නිරාකරණය කරගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශනය ලබාදිය හැකි ආකාරය පරීක්ෂා කරන්න.

2. තරුණ සමාජ ගැටළුවල ස්වභාවය හඳුන්වා දෙමින් ඒවා සමනය කරගැනීම සඳහා බෞද්ධ උපදේශන විධික්‍රම යොදාගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

3. "මනා අඹු-සැමි සබඳතාව සාර්ථක පවුල් ජීවිතයක පදනම වේ." බෞද්ධ උපදේශන මනෝවිද්‍යාව ඇසුරු කරගනිමින් මේ අදහස සාකච්ඡා කරන්න.

4. වර්තමාන සමාජ ගැටළු හමුවේ උපදේශන මනෝවිද්‍යාව වඩාත් ඵලදායීව යොදා ගැනීම සඳහා ගතයුතු ක්‍රියා මාර්ග හඳුන්වා දෙන්න.

5. උපදේශන මනෝ විද්‍යාවට අනුව උපදේශකවරයකු තුළ තිබිය යුතු විශේෂ ගුණාංග පැහැදිලි කරන්න.

6. පුද්ගල කේන්ද්‍රීය ගැටළුවක් විග්‍රහ කරමින් එය විසඳා ගැනීම සඳහා බෞද්ධ උපදේශනය භාවිත කළයුතු ආකාරය පෙන්වා දෙන්න.

අනෙක් පිටුවට ...

7. ආතතිය යනු කුමක් ද? ආතති කළමනාකරණය පිණිස උපයුක්ත බෞද්ධ උපදේශන විධික්‍රම උදාහරණ මගින් පැහැදිලි කරන්න.

8. භාවනා විධික්‍රම උපයෝගී කරගෙන සිදුකළ හැකි මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර පිළිබඳ විමසීමක් කරන්න.

9. බෞද්ධ පාරිසරික මනෝවිද්‍යා උපදේශනය පරිසර සංරක්‍ෂණ සඳහා භාවිත කළ යුත්තේ කෙසේ දැයි පෙන්වා දෙන්න.

10. පහත සඳහන් <u>මාතෘකා අතුරින් දෙකක්</u> පිළිබඳව මනෝවිද්‍යා උපදේශනය ඇසුරෙන් විස්තර කරන්න.

අ.) අභිප්‍රේරණය
ආ.) සහකම්පනය
ආ.) කාංසාව
ඉ.) නව යෞවන ගැටළු
ඊ.) මානසික රෝග පිළිබඳ සමාජ වැටහීම

==========